# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

### ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) හි නව ගොඩනැගිල්ල සඳහා මේස සහ අනෙකුත් ගෘහ භාණ්ඩ සැපයීම

### කොන්ත්‍රාත් (ලංසු) අංකය : TRC/ADM/01/24/04/24-III

1. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති විසින් නව ගොඩනැගිල්ල සඳහා මේස සහ අනෙකුත් ගෘහ භාණ්ඩ සැපයීම සඳහා යෝග්‍ය සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද තරගකාරී ලංසු කැඳවනු ලැබේ.

2. මේ පිළිබඳව උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පරිපාලන සහ ආයතනික කටයුතු අංශයෙන් ලබාගත හැකි අතර, 2025.10.09 දින සිට 2025.10.22 දක්වා ඕනෑම වැඩකරන දිනයකදී 09.00 පැය සිට 15.00 පැය දක්වා කාලයේදී ඉහත ලිපිනයේදී ලංසු ලේඛන පරීක්ෂා කර බැලිය හැක.

3. රජයේ ප්‍රසම්පාදන රෙගුලාසි සහ NPA/Goods/SBD 01 සම්මත ලංසුකරණ ලිපි ලේඛන යටතේ ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටිය (NCB) මගින් ලංසුකරණය මෙහෙයවේ.

4. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලබන සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවී සිටිය යුතු අතර පහත අවශ්‍යතා සපුරා තිබිය යුතුය.

   අ) ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) හි ගෘහ භාණ්ඩ උපාංග සහ උපකරණ (FF&E) සඳහා SP3 හෝ ඉහළ ශ්‍රේණියක් සඳහා ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

   **හෝ**

   ගෘහ භාණ්ඩ නිෂ්පාදකයෙක් හෝ බලයලත් ගෘහ භාණ්ඩ සැපයුම්කරුවකු ලෙස ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි ව්‍යාපාර ආයතනයක් විය යුතු අතර පසුගිය වසර පහ (5) සඳහා අඛණ්ඩව පළපුරුද්දක් තිබිය යුතුය.

5. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට අවශ්‍ය සුදුසුකම් වන්නේ,

   - පසුගිය වසර පහ ඇතුළත ඕනෑම වසර තුනක් (03) ඇතුළත ඉටුකරන ලද ගෘහ අභ්‍යන්තර වැඩ හෝ ගෘහ භාණ්ඩ සැපයීම හෝ නිෂ්පාදනය සහ සැපයීම වැඩ හි සාමාන්‍ය වාර්ෂික පිරිවැටුම අවම වශයෙන් රුපියල් මිලියන 31 ක් විය යුතුය.
   - පසුගිය වසර පහ ඇතුළතදී රුපියල් මිලියන 20 ක ගෘහ භාණ්ඩ සැපයීමේ කොන්ත්‍රාත්තුවක් මාස 6 ක් ඇතුළත හෝ වැඩි වටිනාකමකින් යුත් කොන්ත්‍රාත්තුවක් අනුපාතික කාලයක් ඇතුළත සාර්ථකව සම්පූර්ණ කර තිබීම.
   - මෙම කොන්ත්‍රාත්තුව යටතේ ගෙවීමට සිදුවන ඕනෑම අත්තිකාරම් ගෙවීමක් සහ අනෙකුත් කොන්ත්‍රාත් බැඳීම් හැර තිබිය යුතු අවම ද්‍රවශීල වත්කම් හි අගය රුපියල් මිලියන 10.5 ට නොඅඩු විය යුතුය.
   - කොන්ත්‍රාත් වටිනාකම රුපියල් මිලියන 5 ඉක්මවන්නේ නම් 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරන ලද වලංගු සහතිකයක් තිබිය යුතුය.

6. නැවත නොගෙවන ගාස්තුව රුපියල් පන්දහසක් (රු.5,000.00 ක්) ගෙවීමෙන් සහ ශ්‍රී.ලං.වි.සං.නි. කො. සභාවේ අධ්‍යක්ෂ (පාලන සහ ආයතනික කටයුතු) වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් 2025.10.09 දින සිට 2025.10.22 දින දක්වා 09.00 පැය සහ 15.00 පැය අතරතුර කාලයේදී අභිලාෂී ලංසුකරුවන්ට ඉංග්‍රීසි භාෂාවෙන් සැකසී ඇති ලංසු ලිපි ලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැක. ගෙවීම් මුදලින් කළ යුතුය.

7. මේ පිළිබඳ උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට නිසි පරිදි සම්පූර්ණ කරන ලද ලංසු අනුපිටපතක් සහිතව 2025.10.23 දින 14.00 පැයට හෝ ඊට පෙර ලැබෙන පරිදි ඉහත ලිපිනයෙහි පාලන සහ ආයතනික කටයුතු අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි ගෙනවිත් බහාලිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීමේ කාලය අවසන් වූ වහාම එම අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

8. සියලුම ලංසු සමග, ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමත, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වාණිජ බැංකුවක් වෙතින් ලබාගත් ශ්‍රී ලංකා රුපියල් දෙලක්ෂ දස දහසක (ලංරු. 210,000.00) වටිනාකමින් යුත් ලංසු සුරක්ෂණයක් අමුණා එවිය යුතුය. ලංසු සුරක්ෂණය ලංසු ලිපිලේඛනයෙහි දක්වා ඇති ආකෘතියෙන් යුක්ත විය යුතු අතර 2026.02.05 දක්වා වලංගු විය යුතුය.

9. පූර්ව ලංසු රැස්වීමක් 2025.10.15 දින 10.00 පැයට බිම් මහල් ශ්‍රවණාගාරයේදී පැවැත්වේ.

**ඉහත ලංසු කළයුතු යොමු කළයුතු ලිපිනය වන්නේ,**

**අධ්‍යක්ෂ (පරිපාලන සහ ආයතනික කටයුතු),**
**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව,**
**අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 06.**
**දුරකථන : 0112669789**
**2025.10.08**

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),**
**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව,**
**අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08.**